## 'පට්ඨාන'ධර්ම දේශනා මාලාව - 'වීථිවාර'
## 'කර්ම ප්‍රත්‍යය' - 09. 05.2019

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥසම්මා සම්බුදු පියාණන් වහන්සේට අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයට සම්බන්ධ සියලුම හේතුඵල ධර්මයන්ට අන්තර්ගත වූ සියලු ධර්මයන් ස්කන්ධ වශයෙනුත් ආයතනය වශයෙනුත් ඉන්ද්‍රිය වශයෙනුත් බල වශයෙනුත් ඒවාගේම හේතු ඵල ධර්ම වශයෙනුත් අවබෝධ කොට ගත්තාවූ චතුරාර්ය සත්‍යය ධර්මයන් හැටියට අවබෝධකොට ගත්තාවූ අනන්ත ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්තිනායක සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ සන්තානයේ පහළ වී ලෝකයට දේශනාකොට වදාළ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්මයට මම නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා!

අනන්ත අපරිමාණ ගුණ ඇති සර්වඥයන් වහන්සේගේ ශ්‍රාවක භූමියේ පිහිටියා වූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ අනන්ත ගුණ ඇති බුදුරජාණන් වහන්සේගේ අනන්ත කරුණා ගුණ බලයෙන් මෛත්‍රීයේ ගුණ බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝරත්නයේ සස ගුණ ආනුභාව බලයෙන් තුනුරුවන් ගැන මොහොකට හෝ සිතා නමස්කාර කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් සැම දෙනාම මේ මොහොත වෙනකොට උපදවාගෙන තිබෙන්නා වූ සියලුම කුසල ධර්මයන්ගේ පුණ්‍ය ධර්මයන්ගේ බලයෙන් අදත් අපි මේ දහම් වැඩ සටහන ඔස්සේ ඉදිරිපත්කොට මතුකොට කියලා දෙන්න බලාපොරොත්තු වෙන ධර්ම කාණ්ඩය මේ පින්වත් සැම දෙනාටම ඉතාමත්ම හොඳින් පැහැදිලිව නිවැරදිව වැටහේවා! තේරුම් ගන්න ලැබේවා! කිසිම අවස්ථාවකදී සිතට නීවරණ ධර්මයකින් පාපී අදහසකින් අකුසල චේතනාවකින් පිඩාවක් නොවේවා! බාධකයක් නොවේවා! සිත ඉතාමත්ම පිරිසිදුව පැහැදිලිව තබාගෙන සැමදෙනාටම මේ ධර්ම කාණ්ඩය හොඳින් අසාගෙන මෙනෙහි කරගෙන එය ප්‍රතිපදාවක් මාර්ගයක් කරගෙන ඒකාන්තයෙන්ම උතුම් නිවන් ගමන සුවසේ යා ගන්න ලැබේවා! නිවන් අවබෝධයට ප්‍රතිපදාවක් මාර්ගයක් වේවා! කියලා මෛත්‍රීයෙන් ආශීර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අද මේ පින්වතුන්ට මේ වේලාවට අපි හිතාගෙන තිබෙන ධර්ම කොට්ඨාසය ඉදිරපත් කරන්න සූදානම්.

අද අපිට තිබෙනවා චේතනාවට සම්බන්ධ කරුණු කාරණා ටිකක් තේරුම් අරගෙන ඊට පස්සේ වීථිවාර පිළිබඳව කථා කරන්න. අද කථා කරන්නේ කර්මය කොහොමද ප්‍රත්‍යය වෙලා විසර්ජනා වාර හෙවත් ඒ වීථිවලට ඉදිරිපත් කරගන්න යොදා ගන්න පුළුවන් වෙන්නේ කියලා. පට්ඨාන ධර්ම විග්‍රයේ ප්‍රත්‍යය ධර්මයක්වන **කර්ම ප්‍රත්‍යය** විස්තර කරනවා. අද මේ කථාව කියනකොට අපි විස්වාස කරනවා අපේ මේ පින්වත් හැමදෙනාටම යම්කිසි තරමක අවබෝධයක් පැහැදීමක් ඒ වගේම තේරුම් ගන්න හැකියාවක් මේ තුල ඇත කියලා. ඒකට හේතුව මීට පෙර අපි මේ කර්ම ප්‍රත්‍යය පිළිබඳව යම්කිසි කරුණු ටිකක් පැහැදිලි කළා පට්ඨාන මූලික කරුණු ඉදිරිපත් කිරීමේදී. ඒ ටිකත් මතක තිබෙනවා නම් හොඳයි. අමතක උනා නම් මේ වෙලාවට කියලා දෙන කරුණු ටික හිතේ තබාගෙන වීථි ගලපන්නේ කොහොමද කියලා තේරුම් ගන්න පුළුවන්. **කර්ම ප්‍රත්‍යය** ක්‍රියාත්මක වෙන විදිය දක්වන වීථි හෙවත් විසර්ජනා වාර තිබෙනවා පේළි 7ක්. ඒ පේළි හත ක්‍රියාත්මක වෙන විදිය තේරුම් ගන්න ඒකෙ පදනම පිළිබඳවත් හිතට වද්ද ගන්න ඕනෑ, ඉදිරිපත් කර ගන්න ඕනෑ. නැත්නම් අද අලුතින්ම කියන කොට ඒක කෙනෙකුට ග්‍රහණය කරගන්න බැරි වෙන්න පුළුවන්.

දේශනාවේ තිබෙනවා කර්මය - කර්ම ඵලය කියලා දෙයක්. බුද්ධ දේශනාවේ මේ කර්ම කථාවට ලැබෙන්නේ විශේෂිත තැනක්. මේ කර්මය අපේ සිත තුල සිද්ධ වෙනවා. මේ අපේ හිතේ යම්කිසි චෛතසික ධර්මයක් තිබෙනවා පුදුම බලවත්. ඒවගේම dominant වර්ගයේ අනිත් අය පාලනය කරන්න මෙහෙය වන්න පුළුවන් ආකාරයේ අමුතු චෛතසික ධර්මයක් තිබෙනවා. ඒකට කියනවා **චේතනාව** කියලා. ඒ චේතනාව සෑම සිතකම ක්‍රියාත්මක වෙනවා. අපි දැනගෙන තිබෙනවා සිත් 89 තිබෙන බව. ඒ සිත් ව 89 යම යම්කිසි වැඩක් කරනවා. එක්කෝ බලනවා එක්කෝ අහනවා එක්කෝ ආග්‍රාණය කරනවා, රස විඳිනවා ස්පර්ශ වෙනවා, අතීතය වර්තමානය අනාගතය හිතනවා, මෙනෙහි කරනවා, කුසල් කරනවා, පවු කරනවා. මේ වගේ එක එක සිතට අදාළ යම්කිසි ක්‍රියාවක් කරනවා. ඒ හැම කුසල හෝ අකුසල සිතකම ඔය **චේතනාව** වැඩ කරනවා ක්‍රියාත්මක වෙනවා. ඉදිරිපත් වෙලා තිබෙනවා.

යම් කිසි සිතක් උපදිනකොට මේ **චේතනාව** අවශ්‍යයි. මේ චේතනාවට ඒ හිත පහළ වෙච්ච තැනදී ඒ හිතයි චෛතසික ධර්ම ටිකයි එක්කාසු කරලා ගොනුකරලා අරමුණට දාලා ක්‍රියාත්මක කරවන්න හැකියාව තිබෙන විශේෂ ගුණ ශක්තියක්, මෙහෙය වීමේ බලයක් තිබෙනවා. ඒක නිසා මේ චේතනාව මේ කර්ම ප්‍රකාශනයේදී විශේෂ තැනක් ගන්නවා. එතකොට කුසල කර්මයක් කරනකොට ඒ අදාළ කුසල චෛතසික ධර්ම සමූහයයි හිතයි මේ චේතනාවයි එතැනට එක්කාසු වෙලා කුසල් කරන වැඩේ කරනවා. ඒවාගේම අනාගතයේදීත් මොකක් හරි එකක් කරනකොට ඒක ඉදරිපත් වෙනවා. අතීතයේ දේවලුත් මේ ස්ථානයට ඇදලා ගන්නත් ඒවාගේම හේතු වෙනවා. කුසලයක් කරනකොටත් එහෙමයි. අකුසලයක් කරනකොටත් එහෙමයි. ඉතින් මේ චේතනාව කියන එක තමයි ඔය කර්මය කියලා කියන්නේ. මේ චේතනාව යම් කිසි හිතක වැඩ කරන කරනකොට ක්‍රියාත්මක වෙනකොට ඒකෙ තිබෙනවා වැඩ කරන ක්‍රියාත්මක වෙන විදි දෙකක්. ඒ

තමයි මම අර කලින් කිව්වා වගේ සිතයි චෛතසික ටිකයි යම්කිසි අරමුණක් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යන්නේ එක පොකුරකට. ඔය චෛතසික රංචුව අස්සේ මේ **චේතනාව** තිබෙනවා. එහෙම රංචුවට පොකුරට පහළ වෙනකොට මේකට කියනවා **සහජාත චේතනාව** කියලා. ඒ කියන්නේ **එකට උපන් චේතනාව** කියලා. ඒකට කියනවා **සහජාත කර්මය** කියලා. ඒ කියන්නේ **කර්මය** වශයෙන් වැඩ කරන්නේ **චේතනාව.** එතකොට සහජාත කර්මය හෙවත් සහජාත චේතනාව තිබෙනවා, ඒ පොකුරේ. ඒ රංචුවේ වැඩ කරන ඒ චේතනාවේ තිබෙනවා මෙහෙම ගතියක්, ඒ තමයි ඒ වෙලාවට රංචු වෙලා, ඒ වෙලාවට පොදි ගැහිලා, ඒ වේලාවට මතුවෙලා ඉන්න ඒ සිත සහ චෛතසික කියන පිරිස මෙහෙයවන්න පුළුවන්. ඒ කියන්නේ අරමුණට යවන්න ක්‍රියාත්මක කරන්න අමුතුම විදියේ leadership එකක් ගන්න පුළුවන් ගතිය තිබෙනවා. ඔන්න එක වැඩක්.

එහෙම කරන ගමන් කුසලයක නම් එයා ඒ ටික ඒ වෙලාවේ කරන ගමන්ම අනාගතයට යම්කිසි විපාකයක් හැටියට උපදවන්න පුළුවන් යමකිසි විපාකයක් නිෂ්පාදනය කරන බලයකුත් ඔය අස්සේ පැනගෙන නටාගෙන එයා එකතුකරනවා. එකතුකරලා නැතිවෙලා යනවා. දැන් අපි හිතමු කුසල් සිතක් කියලා. ඒ කුසල් සිතේ චෛතසික ධර්ම 33 අවම වශයෙන් වැඩ කරනවා. ඒ 33 + සිත ඔක්කෝම නාම ධර්ම 34යි. ඔය චෛතසික 33 ඇතුලේ චේතනාව ඉන්නවා. තමන් අයින්වෙන කොට ඉතුරු වෙන්නේ චෛතසික 32යි. මේ චෛතසික 32 සහ හිතටයි මේ චේතනාව කියන ධර්මය පුදුම මෙහෙය වීමේ කටයුත්තක් කරනවා. ඒක **සහජාත චේතනාව** වෙනවා. ඒ කුසලය කරන්න ඉදිරිපත් වෙච්ච චේතනාව සමග ඒ චෛතසික පොදිය ඒ එක්කම වැඩේ කළා නැති වෙලා ගියා. එයා ඉන්න කාලේ මේ රංචුව operate කරලා නැතිවෙලා ගියත් එයා හදපු යම්කිසි බලයක් ශක්තියක් ඉස්සරහට නැකමක් හැටියට සම්බන්ධ තාවයක් තබලා තමයි යන්නේ. එතකොට එයා වැඩ දෙකක් කරනවා, කර්ම එකතුවකුත් කරනවා. පිරිස මෙහෙය වීමකුත් කරනවා. මේ කුසලය පැත්තෙන්.

ඊළඟට ඒක නැතිවෙලා ගියාට පස්සේ අනාගතයේදී ඒ ඉතුරු වෙච්ච ශක්තියෙන් තමයි විපාක සිත් පහළ වෙන්නේ. චක්ඛු විඤ්ඤාණ - සෝත විඤ්ඤාණ - ඝාණ විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කාය විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - තදාරම්මණ වශයෙන් ඉදිරිපත් වෙන ඒවා එන්නේ ඔන්න ඔය හදන ගතිය නිසා. ඉතිං මේක අපි තේරුම් ගන්න ඕනෑ. ඒ වෙලාවට මෙහෙය වීමේ කටයුතු නිසා කියනවා **සහජාත කර්ම ප්‍රත්‍යය** කියලා. ඉස්සරහට විපාකයක් හදන්න මතුකරගන්න උදව්වෙන චේතනා ශක්තියට - කර්ම ශක්තියට කියනවා **නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය** කියලා. මෙන්න මේ විදියට මේකේ තිබෙනවා ස්වභාව ධර්ම දෙකක්. ඒක තේරුම් අරගෙන අද අපි කථා කරමු වීථි වැඩ කරන විදිය.

කුසල වීථියක් මේ විදියට ප්‍රකාශ වෙනවා.

**<u>1) වෙනි වීථිය</u>**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – කුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං කම්මපච්චයෙන පච්චයො.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** = කුසල ධර්මය කුසල ධර්මයට කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වෙනවා. ඔක්කෝම කුසල් සිත් එකතු කරහම තිබෙනවා 21. ඒ තමයි කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර ධ්‍යාන කුසල් සිත් 5 + අරූපාවචර ධ්‍යාන කුසල් සිත් 4 + ලෝකෝත්තර මාර්ග සිත් 4 = 21 යි. මෙන්න මේ කියන කුසල චේතනා සිත් 21 තනියම පහළ වෙන්නේ නෑ. මේ කුසල් සිත් 21 කේ තිබෙනවා ඒ ඒ සිතට ගැලපෙන විදියට වැඩ කරන්න මතු වෙච්ච **චේතනාවක්.** ඒ තමයි **කර්මය** නමින් ප්‍රකාශ කරන්නේ. එවැනි චේතනා 21 ක් තිබෙනවා. මේ චේතනා 21 ඒ ඒ සිත් වලට බැස ගත්තහම මෙහෙය වීම කරනවා, හසුරුවනවා, කර්මයක් හදනවා.

තවත් එකක් දැනගන්න ඕනෑ. දැන් මේ කුසල් සිත් 21 අස්සේ ඉන්න **කර්මය** නමින් ක්‍රියාත්මක වෙන මේ **චේතනාව** කාටද උදව් කරන්නේ කාටද ප්‍රත්‍යය වෙන්නේ? ප්‍රත්‍යය වෙන්නේ **චේතනාව** හැර අනිත් ධර්ම වලට. ආරම්මණ වශයෙන්, ක්‍රියා වශයෙන් ක්‍රියාත්මක වෙන්න මහා විසාල බලපෑමක් සම්මාදමක් එයා දෙනවා. මාර්ග අවස්ථාවේදීත් එහෙමයි. විපස්සනා අවස්ථාවේදීත් එහෙමයි. අවස්ථාව කොහොම උනත් ක්‍රියාත්මක වෙන්නේ ඔය කියන්නා වූ කුසල චේතනා 21 ඒ ඒ තැනට අදාළ ඒවා.

එතකොට මේ පත්‍යය ලබන්නේ කවුද? ලබන්නා තමයි සිතයි අනිත් චෛතසික ධර්ම සමූහයයි. කාගෙන්ද ලබන්නේ? මේ **කර්ම ප්‍රත්‍යයෙන්** හෙවත් **චේතනාවෙන්.** ආන්න ඒ ගැන කියන තැන තමයි **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** = එනම් කුසල ධර්මයක් කුසල ධර්මයකට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා කියන්නේ. ඇයි චේතනාව මෙතැනදී කුසල ධර්මයක් කියලා කිව්වේ? හේතුව, කුසල් සිතක පහළ වෙච්ච නිසයි. කුසල් සිතක චේතනාව පහළ වෙනකොට ඒ කුසල් සිතේ නම මෙයා ගන්නවා. එතකොට ඒ **'චේතනාව'** කුසල චෛතසිකයක් වෙනවා. නමුත් අකුසල් සිතේ පහළ වෙනකොට ඒක 'අකුසල්' කියන නම ගන්නවා.

## 2) වෙනි වීථිය.

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – සහජාතා, නානාක්ඛණිකා. සහජාතා – කුසලා චෙතනා චිත්තසමුට්ඨානානං රූපානං කම්මපච්චයෙන පච්චයො**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් අබ්‍යාකත ධර්මයකට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. නමුත් අපි මතක තබා ගතයුතුයි මේක ආකාරය දෙකකට කියනවා. **සහජාත** කර්ම ප්‍රත්‍යයත් කියනවා. **නා නා ක්ෂණික** කර්ම ප්‍රත්‍යයත් කියනවා. මේක කියලා ඉවර කරගන්න කලබල වෙන්නේ නැතුව ධර්ම කාරණය තේරුම් ගන්න හැම එක්කෙනාම මහන්සි ගන්න. මේවා ජාතක කථා නොවෙයි. මේක දිව්‍යලෝක කථාවකුත් නොවෙයි. මේක නොපෙනෙන, අපිට තියෙනවා කියලා අල්ලා ගන්නත් බැරි බොහොම සූක්ෂම වූ ධර්ම ක්‍රියාවක්. යම්කිසි බල ශක්තියක්. මේ සිත් කියලා කියන ඒවා ඇත්ත වශයෙන්ම ආරම්මණයක් දැන හඳුනා ගැනීමට මතුවෙන මනෝමය නාම ධර්ම ස්වභාවයක්. ඒක ක්‍රියාවක්. ඒවගේ අස්සේ තිබෙන නොයෙක් අකාරයේ පුංචි පුංචි

ක්‍රියාගැන තමයි බුදුරජාණන්වහන්සේ අපිට මේ පුදුම විදියට සියුම්ව දේශනා කරලා තිබෙන්නේ.

අපි කිව්වා **සහජාත කර්ම ප්‍රත්‍යය** සහ **නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය** කියලා. මේ දැන් කිව්වේ කුසල ධර්මයක් කොහොමද අබ්‍යාකත ධර්මයකට මේ දෙකෙන් ඉදිරිපත් වෙන්නේ කියලා. අබ්‍යාකත ධර්මයකට සහජාත කර්ම ප්‍රත්‍යයත් කරනවා නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යයත් කරනවා. මේ දෙවිදියටම ක්‍රියාත්මක වෙනවා. ඒ සහජාත කියලා කිව්වේ එකට පොදියට රංචුවට වැඩ කරන කොට ඒ වේලාවේදීම ක්‍රියාත්මක වෙන හිතටයි චෛතසික ධර්ම සමූහයටයි බලපෑමක් කරනවා. තවත් එකක් තමයි අපි අමතක කරන්න හොඳ නෑ, සිත ආශ්‍රය කරගෙන සිතේ බලයෙන් පහළ වෙනවා **චිත්තජ රූප** කියලා කොටසක්. අන්න ඒ චිත්තජ රූප වලටත් මේ චේතනාව යම්කිසි බලපෑමක් කරනවා, ඒවා උපදවන්න. චිත්තජ රූපත් උපද්දවනවා අනිත් ඒවාටත් උදව් වෙනවා.

ඊළඟට අව්‍යාකෘත ධර්ම කියලා කියන්නේ ඒ අවස්ථාවේදී අර කියන්නා වූ කුසල් සිත් ආශ්‍රය කරන්නාවූ තැන පහළ වෙන රූප. මේ රූප පහළ වෙන්නේ **චේතනාව** නිසයි. මේ අවස්ථාවේදී කුසල ධර්මය අර අව්‍යාකෘතය කියන්නා වූ රූප ධර්මයට මතුවෙන්න හේතුවක්, ඒවගේම ප්‍රත්‍යයක්, ඒවාගේම උපකාරයක් වෙනවා. ඒක නිසා තමයි කියන්නේ **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** කියලා. ඊළඟට ඉස්සරහදි ඇති වෙන ඵලයක් අල්ලාගෙන කරන නිසා කියනවා **නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය** ඉදිරිපත් කරනවා කියලා.

ඊළඟට තව එකක් අපි අවබෝධ කරගනිමු. ඒ තමයි, ඔය **නා නා ක්ෂණික** කර්ම ප්‍රත්‍යය දුරයි. **සහජාත කර්ම ප්‍රත්‍යය** ළඟයි. එක කාමරයක ඉන්න පිරිස වගේ තමයි **සහජාත කර්ම ප්‍රත්‍යය. නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය** එහෙම නොවෙයි. ඒක ටිකක් ඈතට අදිනවා. අපිට හිතෙන්නේ නෑ කොයි හරියෙන්ද ඕක මතුවෙන්නේ කියලා. අපි බලමු **නා නා ක්ෂණික කර්ම** ප්‍රත්‍යය කොහොමද **කුසල කර්මයක් අව්‍යාකෘතයකට** බල පෑමක් කරන්නේ කියලා. මේක අවස්ථා දෙකක්. කාල වශයෙන් දෙකක්.

අපි මෙහෙම හිතමු. අපි වන්දනාවක් කරනවා. වන්දනාවක් කරන වේලාවේදී කුසල් සිත් පහළ වෙනවා. ඒ කුසල් සිත් කාමාවචර කුසල් සිත්. ඒ කුසල් සිත් අස්සේ තිබෙනවා **චේතනාව**. අපි හොඳටම දන්නවා. ඒ චේතනාව ඒ වේලාවේදී **සහජාත වශයෙන්** ඒ ඒ සිත් වලට චෛතසික වලට උපකාරයක් වෙනවා. ඒ හැර ඒ සමග පහළ වෙන **චිත්තජ රූප** වලටත් **සහජාත චේතනාව** යම්කිසි බලපෑමක් කරනවා. ඔන්න දැන් රූප වලටත් ඒ කියන්නේ අව්‍යාකෘත වලටත් උදව් වෙලා උපකාර වෙලා නැතිවෙලා ගියා. අපි වන්දනා කළා. ඒක ඉවරයි.

ඊළඟට අපි අපේ ජීවිතිය අවසන් කරලා මරණයට පත්වෙනවා. මරණයට පත් උනාට පස්සේ ඒ කරපු කුසල කර්මය නිසා ප්‍රතිසන්ධියක් ගන්නවා. ඔය ප්‍රතිසන්ධිය ලබන වේලාවේදී ඇති වෙනවා ප්‍රතිසන්ධි සිත. ආන්න ඒ ප්‍රතිසන්ධි සිත පහළ වෙනවා ඒ සිතට ඉන්න පුළුවන්, ආශ්‍රය කරන්න පුළුවන් විදියේ කර්මයෙන් උපන්නා වූ රූපයක් ඇතුව.

එතකොට ඒ වෙලාවේදී පහළ වෙන ප්‍රතිසන්ධි සිතත් ඒවාගේම **කර්මජ රූපත්** දෙකම **විපාක.** නමුත් ඒ ප්‍රතිසන්ධි විපාක සිත එනම් ඒ **කර්මජ රූප** ටික උපදවාදෙන ඒ කුසල සිතට පහළ වෙන්න ඒකෙ ශක්තිය ඇති උනේ අපි වන්දනා කරන වෙලාවේ. දැන් බලන්න, වන්දනා කරන අවස්ථාවේ දී පහළ වෙච්ච ඒ චේතනාවක සැර බලය, සැරට ගිය ශක්තිය තමයි අර ප්‍රතිසන්ධියක් හදන්න ඉලිප්පිලා මතුවෙලා ආවේ. ඒක නිසා **ප්‍රතිසන්ධි සිත අව්‍යාකෘතයි. කර්මජ රූපත් අව්‍යාකෘතයි.** හැබැයි කර්මයෙන් උපන් මේ සිතත් රූපයත් දෙකම ඊට ක්‍ෂණ ගොඩකට කලින් පහළ වෙච්ච **කර්මයක ප්‍රත්‍යය** ලබාගෙන එන එකක්. ඔන්න ඔය විදියට **කුසල ධර්මයක් අව්‍යාකෘතයකට** බලපාන විදිය අපි තේරුම් ගත යුතුයි. ඉස්සර කරපු ඔය කුසල් වල බලය තමයි මේ ඉල්ලිපිලා එන්නේ.

තවත් තිබෙනවා අපි කථා කළ යුතු **කාමාවචර විපාක.** ඒවා පහළ වෙනවා ප්‍රතිසන්ධි වශයෙන්. ඊළඟට භවාංග වශයෙන්. ඊළඟට චුති වශයෙන්. ඒ හැම තැනකදීම මේවා පහළ වෙන්නේ **නා නා ක්ෂණික කර්මයේ** බලය නිසයි. දැන් තවත් එකක් තිබෙනවා. ඒ තමයි මේ වෙලාවේ මේ මොහොතට අපිට තිබෙනවා විපාක සිත් අවස්ථා දෙකක්.

- එකක් තමයි බාහිර ලෝකයට නිරාවරණය වෙලා ගියා වූ අරමුණු ඔස්සේ ගිහිල්ලා ලබා ගන්න ඒවා එක්ක බැඳී යන විපාක සිත් තිබෙනවා.
- ඒවාගේම හිත අස්සට රිංගාගෙන භවාංග සිතක පෙළගැස්සීමක් වශයෙන් ඇති වෙච්ච විපාක සිත් තිබෙනවා.

දැන් එතකොට විපාක සිත් තිබෙනවා බාහිර ලෝකයට විවෘත වූ සහ හිත ඇතුලේ තිබෙන දේවල් වශයෙන් දෙකක්. මේ වෙලාවේ විපාක අපිට එන්නේ ඉස්සර වෙලා තිබ්බ්ච කර්මයක බලයෙන්. එතකොට මේක **නා නා ක්ෂණිකයි.** හැබැයි ඒක ගෙනියන්න අමාරුයි. යම් කිසි අවස්ථාවකදී ඒකෙ බලය අඩු උනහම කඩා වැටෙනවා.

තවත් අහේතුක සිත් තිබෙනවා 18ක්. ඒ අහේතුක සිත් 18 තුල ක්‍රියා සිත් 3 ක් තිබෙනවා පංචද්වාරාවජ්ජන - මනෝද්වාරාවජ්ජන - හසිත උත්පාදන සිත කියන සිත් තුන අයින් කරපු ගමන් අනිත් ඉතුරු වෙන්නා වූ සිත් 15 **විපාක සිත්.** මේ විපාක සිත් ටික උපදවන්න **කුසල වශයෙන් ඇති වෙච්ච කර්ම ප්‍රත්‍යයත්** තිබෙනවා **අකුසල වශයෙන් ඇති වෙච්ච කර්ම ප්‍රත්‍යයත්** තිබෙනවා. ඒ කර්ම ප්‍රත්‍යයේ ආනුභාවයෙන් තමයි මේක හිටපු ගමන් ඉල්ලිප්පිලා මතුවෙලා එන්නේ. ඉතින් ඔය **අහේතුක විපාක** සිත් හැදෙන්න කොහේ හෝ වේවා යම්කිසි තැනක කර්ම ශක්තියක් එන්න ඕනැ.

තව එකක් තිබෙනවා, දැන් **අහේතුක කුසල සිත්** සහ **අහේතුක අකුසල සිත්** පහළ වෙන්න ඉස්සර වෙලා අහේතුක පිං පවු කළාද? නෑ. අහේතුක පිං පවු කියලා නෑ. ඒවා හැදෙන්න හේතු වෙච්ච සිත් **සහේතුකයි. සහේතුක කුසල් - සහේතුක අකුසල්** යන දෙකම නිසා තමයි මේ වේලාවේ **අහේතුක සිත්** පහළ වෙලා තිබෙන්නේ.

ඊළඟට **රූපාවචර** ධ්‍යාන සිත් ගත්තහම ඒ ධ්‍යාන පහළ කරන අවස්ථාවේදී ධ්‍යාන සිතක විපාකයක් වින්දනය කරනකොට ඒ සිත නිසා ඇතිවෙන **කර්මජ රූපයන්ටයි** ඒවාගේම **විපාක චිත්තයන්ටයි** බලපාන නිසා එතැන තිබෙනවා **කර්ම ප්‍රත්‍යය, නා නා ක්ෂණික** වශයෙන්. අවස්ථා දෙකක සිද්ධ කරලා දෙන්නා වූ බලපෑම් වශයෙන්.

ඊළඟට **අරූපාවචර විපාකත්** එහෙමයි. අරූපාවචර භාවනාවක් කරනවා මනුස්ස ලෝකයේ හරි දිව්‍යලෝකයේ හරි ඉන්න අය. එහෙම නැත්නම් රූපාවචර බ්‍රහ්මලෝකයේ ඉන්න කෙනෙක් ගැන හිතා ගමු. එහෙම කෙනෙක් අරූපාවචර කුසල් සිත් පහළ කරනවා. ඒ අරූපාවචර කුසල් සිත් පහළ කරහම ඒ ආරම්මණය අරූපාවචර උනාට ඒ හිතේ බලයෙන් ඒ වෙලාවේ මනුස්ස ලෝකයේ තිබෙන ඇඟේ රූප පහළ වෙන එක වෙන එකක්. නමුත් එයා මැරිලා ගිහිල්ලා උපදිනවා අරූපාවචර බ්‍රහ්මලෝකයේ. ඒ උපදින වෙලාවට රූප නෑ. ඒක නිසා **රූප අව්‍යාකෘතය මතුවෙන්නේ <u>නෑ</u>** එතැන. හැබැයි **විපාක අව්‍යාකෘතය** පහළ වෙනවා, ඒ තමයි **ප්‍රතිසන්ධි වශයෙන්** ඊළඟට **භවාංග වශයෙන්** සහ **චුති වශයෙන්,** අරූපාවචර ලෝකයේ.

අනිත් එක තමයි සෝවාන් වෙන අවස්ථාවේදීත් පහළ වෙනවා චේතනාවක්. සකෘදාගාමී වෙන අවස්ථාවේදීත් අනාගාමී වෙන අවස්ථාවේ අරහත් වෙන අවස්ථාවේදීත් ඒ මාර්ග සිත් හතරේ චේතනා පහළ වෙනවා. ඒ චේතනා පහළ උනහම ඒකෙන් ඇතිකරලා දෙන්නා වූ බලය ලබා දෙන්නේ අවස්ථා දෙකක. දැන් **මාර්ග සිත** ඇතිවෙන වේලාවේම **ඵල සිත** ඇති වෙන්නේ නෑ. **මාර්ග සිත** ක්‍ෂණයක් ඇවිල්ලා ඒක නැතිවෙලා ගියාට පස්සේ තමයි **ඵල සිත** පහළ වෙන්නේ. එතකොට **මාර්ග සිත** ඇතිකරපු ඒ දේ තමයි **ඵල සිත** හැටියට ඉදිරිපත් වෙලා නැවත මතුවෙලා එන්නේ. එතකොට ඒ **සෝවාන් ඵල සිත - සකෘදාගාමී ඵල සිත - අනාගාමී ඵල සිත - අරිහත් ඵල සිත** යන අවස්ථාවට එනකොට ඒක විපාකයක් වෙනවා. ඒක විපාකයක් හැටියට සලකනවා. ඒක අවස්ථා දෙකක්. මාර්ග අවස්ථාවෙන් බැහැර වෙච්ච ඵල අවස්ථාව ලබන කොට ඒකට කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** කියලා. මෙන්න මේ විදියට අවස්ථා දෙක අපි හොඳට පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ මේ කර්ම කථාවේදී.

ඊළඟට අපි තව පැත්තකට යමු.

**<u>3) වෙනි වීථිය</u>**

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – කුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො.**

මෙතන කියන්නේ **'කුසල ධර්මය කුසලයටයි අව්‍යාකෘතයටයි දෙකටම කර්ම ප්‍රත්‍යයෙන් උපකාරයක් ලබනවා'** කියන එක. මේක හරිම අමුතුයි. පුංචි පෙන්නේ නැති නමුත් බලවත් වූ මානසික ධර්මයක්, ඒවගේම තවත් මානසික ධර්මයකට ළඟ සහ දුර වශයෙන් කාලය අරගෙන මහා බලපෑමක් කරනවා. අපිට ඒක මීටරයකින් අල්ලන්න බෑ. නමුත් ඒක තිබෙනවා. **කුසල** සහ **අව්‍යාකෘත** දෙකටම **කර්ම ප්‍රත්‍යය** බලපානවා.

කුසලය, කුසලයටත් අව්‍යාකෘතයටත් බලපාන විදිය මෙහෙම හිතමු. අපි කිව්වා අපි මල් පූජා කරනවා කියලා. ඒ වෙලාවේදී කුසල් සිත් පහළ වෙනවා. ඒ කුසල් සිත්වල තිබෙනවා චේතනාව. ඒ චේතනාව කුසල ධර්මයක්. ඒ කුසල ධර්මය චෛතසික ධර්ම සමූහයටයි හිතටයි බලපාන නිසා ප්‍රත්‍යය වෙන නිසා ඒකට කියනවා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස** කියලා. ඒවෙලාවේම ඒක රූපයකටත් බලපානවා. ඒ බලපෑම සිදු කරන්නේ චිත්තජ රූපයන්ට. එතකොට බලන්න එක පැත්තකින් ඒ චේතනාව තම වර්ගයා හැටියට ඉන්නාවූ නාම ධර්මයන් වලට එනම් චෛතසික ධර්මයන් සහ හිතට කුසල ධර්මයක් හැටියට ප්‍රත්‍යය උනා - තමන්ගේ වර්ගයාගෙන් අයින් වෙච්ච සම්පූර්ණයෙන්ම වෙනස් වෙච්ච රූපයකටත් ප්‍රත්‍යය උනා. රූපය කියන්නේ අව්‍යාකෘතයක්. අන්න ඒක නිසා ඒ ක්‍රියා දෙකම එක තැන සිද්ධ වෙන නිසා කියනවා **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** කියලා.

මම හිතනවා මේ කියන කථාවල් අපේ මේ පින්වතුන්ට හිතට අහුලා ගන්න පුළුවන් කමක් තිබෙනවා කියලා. සමහර වේලාවට මේක ඒක වචනයෙන් කියනවා. නැත්නම් 'ස්කන්ධ' යන වචනයෙනුත් කියනවා.

අපි ඊළඟට බලමු

## <u>4) වෙනි වීථිය</u>

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – අකුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං කම්මපච්චයෙන පච්චයො**

අකුසල ධර්මයක් අකුසල ධර්මයකට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය බලයෙන් උපකාර වීම් වශයෙන් උපකාර වෙනවා. මේ කියන්නේ අපි නිතර කථා කරන අකුසල් සිත් 12 + චෛතසික ධර්ම 28.

දැන් පළවෙනි **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** ඉදිරිපත් කරගෙන කර්මයක් කරන වේලාවේදී එතැන තිබෙන්නේ අකුසල් රංචුවක්. ඔක්කෝටම කියන්නේ අකුසල් කියලා. ලෝභයත් තිබෙනවා මෝහයත් තිබෙනවා. ඒවාට ළං වෙලා කිට්ටුවෙලා ඒවත් එක්ක ඉන්න චේතනාව ඇතුළු ඔක්කෝම ටිකට කියනවා අකුසල කියලා. එතකොට මේ අකුසල රංචුවේ ඉන්න **චේතනාවට** කියනවා **අකුසල චේතනාව** කියලා. ඒක නිසා මේ චේතනාව කුසල් සිතේදී කුසල උනාට අකුසල් සිතේදී මේ චේතනාව නම් කරන්නේ අකුසල ධර්මයක් කියලා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො** = අනිත් චෛතසික ධර්ම 26 ට ඒවාගේම හිතට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

ඊළඟට ප්‍රත්‍යය උප්පන්නය, ඒ කියන්නේ එයාගේ බලය මෙහෙයවීම බලපැවැත්වීම ඇඟට වද්දගන්නේ අර චෛතසික ධර්ම. ඒවාගේම ඒ සිත. මේ තමයි ඒ නාම ධර්ම සම්පූර්ණයෙන්ම වෙනස් කරලා ප්‍රකාශ කරපු සහ තෝරලා දීපු විදිය. ඒක ඉස්සෙල්ලා

කියපු කුසල ධර්ම අනුසාරයෙන් තේරුම් ගන්න පුළුවන්, වෙනස් වෙන්නේ 'අකුසල ධර්ම' පමණයි.

ඊළඟට තව එකක් තිබෙනවා.

5) වෙනි වීථිය

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – සහජාතා, නානාක්ඛණිකා.**

මේකත් ඒ විදියයි. කුසලය ගැන කථා කරපු විදියමයි. බලන්න, අකුසල ධර්මය ඒ කියන්නේ අකුසල සිතක තිබෙන කර්ම වැඩේ කරන **චේතනාව**. කර්ම වැඩේ කරන **චේතනාවට තමයි අකුසල ධම්මො** කියලා කියන්නේ. ඊළඟට **අබ්‍යාකත ධම්ම** කියලා කියන්නේ අකුසලය කරන වේලාවට පහළ වෙන්නා වූ **රූප.** ඒවාගේම **නා නා ක්ෂණික** වශයෙන් **කර්ම ප්‍රත්‍යය** ලබාගෙන **විපාකයට යනවා = අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – සහජාතා, නානාක්ඛණිකා.**

අපි කිව්වා ඒ වෙලාවටත් චේතනාව **සහජාත** වශයෙනුත් බලපෑමක් කරනවා කියලා. ඒ අකුසල කර්මයේ බලයෙන් ඊට පස්සේ කොහේ හරි තැනක උප්පත්තිය ලබන්න යනවා නම් ප්‍රතිසන්ධි වශයෙන් අකුසල විපාකයක් උපදවනවා, භවාංග වශයෙන් අකුසල විපාක උපදවනවා. ඒවාගේම බාහිර වශයෙන් එක එක දේවල් පෙන්නුම් කරන්න අස්සවන්න අවස්ථාව සලසා දීම වශයෙන් **නා නා ක්ෂණික කර්ම** ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මේ අව්‍යාකෘත ධර්මයකට බලපාන විදිය. පසුගිය කාලයේම අපි අව්‍යාකෘත ධර්ම පිළිබඳව කථා කළා. **විපාක සිත් අව්‍යාකෘතයි** කියලා කිව්වා. ඊළඟට **රූප ධර්ම අව්‍යාකෘතයි** කියලා කිව්වා.

ඊළඟට අපි බලමු අකුසල ධර්මයක් අකුසලයකටයි අකුසල ධර්මයක් ඒවෙලාවෙම අව්‍යාකෘතයකටයි බලපාන හේතු භූත වෙන විදිය.

6) වෙනි වීථිය

**අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – අකුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො.**

පවු කරන වේලාවේදී ඒ පාපී හිතේ තිබෙන්නා වූ අකුසල චේතනාව - අකුසල ධර්මය ඒ වේලාවේම අනිත් අකුසල චෛතසික ධර්මයන්ටත් හිතටත් බලපෑමක් කරනවා උපකාර වෙනවා, ඒ වගේම ඒ වේලාවේදීම අකුසල සිතින් පහළ වෙන චිත්තජ රූපයන්ටත් බලපානවා. ඒක නිසා ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට අකුසල සිත් 12 ත් එනවා. චෛතසික 26 ත් එනවා. චිත්තජ රූපයෝ ටිකත් ඉදිරිපත් වෙනවා. මේ විදියට අකුසල පැත්තට ගියහම එක අවස්ථාවේදීම අකුසලයටයි අව්‍යාකෘතයටයි දෙකටම බලපානවා.

ඊළඟටතව එකක් තිබෙනවා. අපි මේක අවසාන වශයෙන් ඉදිරිපත් කරන කොට්ඨාසය. ඒ තමයි හත් වෙනුව කියන්නා වූ වීථිය.

7) වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො – විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං, චිත්තසමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො. චෙතනා වත්ථුස්ස කම්මපච්චයෙන පච්චයො.**

හරි වැදගත් තැනක්. **අව්‍යාකෘත ධර්මයක්** කොහොමද **අව්‍යාකෘත ධර්මයකට** කර්මප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ. ඒක මෙහෙමයි තේරුම් ගන්නේ. මේ වෙලාවේදී මොකක් හරි රූපයක් අපිට පේනවා. ඒ අවස්ථාවේදී පහළ වෙන්නේ චක්ඛු විඤ්ඤාණය. චක්ඛු විඤ්ඤාණය තුල තිබෙන්නේ නාම ධර්ම 8යි. ඒ නාම ධර්ම 8 කියලා කියන්නේ **ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනසිකාර**. මෙතැන තිබෙනවා චෛතසික ධර්ම 7ක්. ඊළඟට සිත. ඔක්කෝම 8යි. මේ ධර්ම 8 ඔක්කෝම **විපාක**. ඒක නිසා ඒ රංචුවම **අව්‍යාකෘත** ධර්ම රංචුවක්. මේ අව්‍යාකෘත ධර්ම රංචුවේම ඉන්න **චේතනාව** ඇති වෙන්නෙත් **විපාකයක්** හැටියටයි. ඒක **අව්‍යාකෘත ධර්මයක්**. ඒ අව්‍යාකෘත ධර්මය ඒ වෙලාවේදී තමන් එක්ක පහළ වෙන්නා වූ ධර්ම වලට නා නා ක්ෂණික වශයෙන් නොවෙයි ඒ වේලාවේදී **සහජාත වශයෙන්** බලපෑම් කරනවා. **විපාක සිත්** වලටත් ඒ වගෙයි, ක්‍රියා සිත් වලටත් ඒ වගෙයි.

දැන් ක්‍රියා සිතක් පහළ වෙනකොට නම් රූපත් වැඩ කරනවා නමුත් විපාක සිත් පහළ වෙනකොට චක්ඛු විඤ්ඤාණ සෝත විඤ්ඤාණ ඝාණ විඤ්ඤාණ ජිව්හා විඤ්ඤාණ කාය විඤ්ඤාණ කියන හරියේදී රූප පහළ වෙන්නේ නෑ. නමුත් අනිත් විපාක සිත් පහළ වෙනකොට රූපත් පහළ වෙනවා. ඒ වෙලාවට වෙන්නේ **අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයකටම කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය** වෙනවා කියන කාරණය.

ඒකෙ එකක් තිබෙනවා, එතැනට එනකොට **නා නා ක්ෂණික** වශයෙනුත් බලපානවා. ඒ වෙලාවට **සහජාත** වශයෙනුත් බලපානවා. **ක්‍රියා සිත්** වලත් එහෙමයි **විපාක සිත්** වලත් එහෙමයි. මෙන්න මේ කාරණා ටික අපි මේ අවස්ථාවේදී තේරුම් ගනිමු. මම හිතනවා මේ කථාව අපි මීට පෙර අවස්ථාවකදී යම් කිසි මට්ටමකට මේ පින්වතුන්ට තේරුම් ගන්න කියලා දුන්නා.

ඉතින් අද මේ විසර්ජනා වාර හතෙන් කියපු ටික මේ පින්වතුන්ට යම්කිසි මට්ටමකට ග්‍රහණය කරගන්න එක්කාසු කරගන්න හිතට යොමු කරගන්න පුළුවන් වෙන්න ඇත කියලා මම විස්වාස කරනවා. ඉතින් **නා නා ක්ෂණික** අවස්ථාව **සහජාත** අවස්ථාව කියන දෙක හොඳට පැහැදිලිව වෙන් වෙන්ව තේරුම් ගන්න. මේක භාවනාවක් හැටියට අපිට

මෙනෙහි කරන්න පුළුවන්. සතියකට වතාවක් එක්කාසු වෙලා ගැඹුරු ධර්ම විවරණයක් කරලා අපි විසිර යනවා. නැවත බ්‍රහස්පතින්දා වගේ කිට්ටු වෙනකොට නැවත එක්කාසු වෙනවා. ඉතින් එහෙම ආවයින් පස්සේ ගිය සතියේ අහපු ඒවා අහලා තිබුණා නම් ඒවා ලේසියෙන් මතකයට එනවා. ලෝකයේ තිබෙන්නා වූ වැඩ කටයුතුත් එක්ක හිරවෙලා ගියහම මේක අමතක වෙනවා. එහෙම අමතක උනහම නැවත මේක ඉදිරිපත් කරගන්න ගියහම හිතට නොවැටහෙන ස්වභාවයක් ඇතිවෙනවා. ඉතින් මේක භාවනාවක් හැටියට, 'මෙන්න මෙහෙමයි මේ වැඩේ සිද්ධ වෙන්නේ, මෙන්න මෙහෙමයි මේකේ කාර්ය සිද්ධ වෙන්නේ' කියලා හොඳට භාවනාවක් හැටියට මෙනෙහි කිරීමට අපිට පුළුවන් කම තිබෙනවා නම් එතකොට මේ 'චිත්ත ධර්ම - මේ කුසල අවස්ථාව - මේ අකුසල අවස්ථාව - මේ විපාක අවස්ථාව - මේක වැඩකරන්නේ මෙහෙමයි' කියලා කර්ම ප්‍රත්‍යය මෙනෙහි කර කර මෙනෙහි කර කර ධර්මය දැක දැක ධර්මය තුලම හිත හසුරුවන්න පුළුවන්. ඒක නිසා ගම්භීර ධර්මය කීම සිතීම මෙනෙහි කිරීම ඇසීම භාවනාවකට ඒකාන්තයෙන්ම උදව් වෙනවා, උපකාර වෙනවා.

මේවා සත්වයෝ නොවෙන ඒවාගේම පුද්ගල ආත්ම ජීව දේව නොවෙන හුදෙක් ධර්ම මාත්‍රා පමණයි. මේවාට අයිති කාරයෝ නෑ. මේවා මේ විශ්වයේ ඉබේ පහළ වෙන ධර්ම ස්වභාව. මේ ධර්ම ස්වභාව ක්‍රියා ගොඩක් පමණයි. එකින් එකට බලනවා, දකිනවා, හිතනවා වාගේ ක්‍රියා මාත්‍රා පමණයි. ක්‍රියාවක් කරන කොට අනිත් පැත්තෙන් තව එකක් මතුවෙනවා. ඒක ඉවර වෙනකොට තව එකක් මතුවෙනවා. මේවා ක්‍රියා මාත්‍රා පමණයි. ඒ ඒ තැන් වල කුසල වශයෙන් හැප්පෙන හැටි ඉදිරිපත් වෙන හැටි බලපාන හැටි, අකුසල වශයෙන් බලපෑමක් කරන හැටි, ඒවාට යටවෙන ඒවා ඊළඟට අව්‍යාකෘත වශයෙන් බලපෑමක් කරන විදිය සහ ඒ බලපෑමට යටත් වෙන විදිය යන මෙන්න මේ කථාව තමයි මේ කර්ම ප්‍රත්‍යය තුල මේ විදියට කියලා දුන්නේ. ඉතින් අද මේ පින්වතුන්ට ඉස්සෙල්ලා අහපු ඒවත් එක්කාසු කරගෙන මේ ටික ගලපාගන්න යම් කිසි පුළුවන් කමක් තිබෙනවා නම් එය බොහෝ වාසනාවන්තයි.

මම හිතන විදියට මේ කර්ම ප්‍රත්‍යයේ **නා නා ක්ෂණික සහ සහජාත** වශයෙන් කියන කථා මීට ඉස්සෙල්ලාත් අපි ගොඩක් කථා කළා. ඒක නිසා මේ කොටස මේ පින්වතුන්ට තේරුම් ගන්න යම්කිසි පහසුවක් වෙනවා ඇති කියලා මම විස්වාස කරනවා. ඉතින් මේ ධර්මය තේරුම් අරගෙන මේ ධර්මය හිතාගෙන මෙනෙහි කරගෙන මේ ධර්මය ඉතාමත්ම හොඳින් දරාගෙන මේවාගේ තිබෙන්නා වූ හේතු ඵල ධර්මයන්ගේ ස්වභාවය තේරුම් අරගෙන සංසාර දුකෙන් මිදිලා සැම දෙනාටම අමාමහා නිර්වාණ ධාතුවෙන් සැනසෙන්න ලැබේවා! නිවන් පිණිස මේ මනසිකාරය ඒකාන්තයෙන්ම හේතු වේවා! කියලා මෛත්‍රීයෙන් පිං දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අන්තිමට කියපු වීථිය අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්මපච්චයෙන පච්චයො කියන තැනදී සහජාත කර්ම ප්‍රත්‍යයෙන් පමණක්ද ප්‍රත්‍යය වෙන්නේ?

<u>පිළිතුර</u> - ඔව් මහත්තයා එතැන තිබෙන්නේ ප්‍රවෘති කාලයට සම්බන්ධ කරලයි. ප්‍රවෘති කාලයේ ඒ කියන්නේ ඒ පවතින අවස්ථාවේදී ඒ ධර්ම ශක්තිය උපකාර වෙන විදිය. ඊළඟට ඒක විපාකයටත් ඒවාගේම ප්‍රතිසන්ධි අවස්ථාවේ - භවාංග අවස්ථාවේදී - ක්‍රියා අවස්ථාවේදීත් ඒවගේම සම්පටිච්ඡන සන්තීරණ ආදී විපාක සිත් පහළ වෙන අවස්ථාවේ පහළවෙන කර්මජ රූපත් අව්‍යාකෘත බලයක් නිසයි පහළ වෙන්නේ. ඒවාගේම ඒවාට යටත් වෙන චේතනාවයි අනිත් චෛතසිකයි ඔක්කෝම අව්‍යාකෘත වෙනවා. ඒ පහළ වෙන චිත්ත ගතිය පමණක් අව්‍යාකෘත ධර්මය හැටියට මේ මාතෘකාව යටතේ කියනවා.

<u>ජයන්ත මහත්මයා</u> - බොහොම පිං ස්වාමීන්වහන්ස එතැනදී තේරුම් කරගත්තේ නා නා ක්ෂණිකව නොවෙයි සහජාත ප්‍රත්‍යයෙන් පමණයි එතැන ප්‍රත්‍යය වෙන්නේ කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මේකේ සමහර වීථී නා නා ක්ෂණිකද සහජාත ද කියල කියලා නෑ. ඒ කියලා නැති තැන් වල සහජාත කියලා තේරුම් ගන්න වෙනවා කියලයි තේරුණේ. ඊට පස්සේ අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කියන තැනේදී නා නා ක්ෂණිකව වෙනකොට තමයි මම හිතන හැටියට අසඤ්ඤ තත්වය සමබන්ධ වෙන්නේ කියලා තේරුණා. අනිවාර්යෙන්ම කුසලයක විපාකයක් හැටියට තමයි අසඤ්ඤ සත්වයෝ හටගන්නේ. එතකොට ඒක නා නා ක්ෂණිකව හටගන්නා අවස්ථාවක් හැටියට තමයි තේරුණේ.

<u>පිළිතුර</u> - ඔව්, නා නා ක්ෂණික තමයි. සහජාතයක් එතැන කොහොමත් එන්නේ නෑ. ඒක හරි. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන්වහන්ස අප්‍රමාණ පිං ඔබවහන්සේ අදත් ඔබවහන්සේගේ කාලය නොබලා මේ විදියට අපිට කරන උපකාරයට. ඔබවහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ වැඩ සටහන නිමා කරන ලෙසට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - සැම දෙනාටම රත්නත්‍රයේ පිහිටයි ආරක්ෂාවයි. ඉතින් අද අපි පැයක් විතර අරගෙන කෙටියෙන් අවසන් කලත් අපිට හිතෙන හැටියට මේ කර්ම ප්‍රත්‍යය කියන මාතෘකාව කථා කරන්න ඕනෑ කාලයක් තමයි මේ හැම කෙනාටම ඉදිරිපත් වෙලා තිබෙන්නේ. එක එක්කෙනාගේ කර්ම රැස් වෙනවා එක එක්කෙනාගේ කර්ම ගෙවී යනවා. ඒ කර්ම නා නා ක්ෂණික වශයෙන් සහජාත වශයෙන් ඉදිරිපත් වෙලා රැලි වශයෙන් යන විදියක් තමයි තිබෙන්නේ. ඒකෙනුත් කුසලො ධම්මො වලට වඩා අකුසලො ධම්මො හැටියක් තමයි දැන් තිබෙන්නේ.

කොහොම හරි මේ හේතුඵල ක්‍රියා රංචුවෙන් මේ හේතුඵල ක්‍රියා සමුහයෙන් අයින්වෙලා ඒවා තේරුම් අරගෙන එපාවෙලා ඒවාගේ කලකිරිලා ඒවාට ගැති නොවී අයින්වෙලා

යනතාක් කල් මේ දුක්ඛස්කන්ධය මේ විදියමයි. ඒක නිසා අද ධර්ම සාකච්ඡාව ධර්ම දේශනාවට ඇහුම්කන් දීම තුලින් අපේ පින්වත් පිරිස මහා විසාල කුසලයක් උපදවාගත්තා. මේ කුසල් බලයෙන් සහ බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් සැම දෙනාටම ආරක්ෂාව ඇතිවේවා! සියලු දෙනාගේම සිත් වලට හොඳ ඉවසීමේ ගුණය ඒවාගේම ඥානාන්විතව කල්පනා කිරීමේ, ධර්මය තේරුම් ගැනීමේ ගුණය පහළ වේවා! ප්‍රඥාව පහළ වේවා! ප්‍රඥාව අවධි වේවා!

මේ වැඩ කරයුතු කරගෙන යන්නාවූ පින්වත් ලලිත් මහත්මයාටත් පවුලේ හැම දෙනාටමත් මෙහෙය වීම් කටයුතු කළාවූ පින්වත් ජයන්ත මහත්මයාටත් ප්‍රශ්න ඇසූ බෘනෝ මහත්මයාටත් අනිත් සැම දෙනාටමත් මේ උතුම් පිං බලයෙන් කුසල් බලයෙන් ඉතාමත්ම හොඳින් තව තව ගැඹුරු ධර්මයට එක්කාසු වෙලා මුහුදේ පතුලට යන්න වගේ එහි තිබෙන වටිනා දේවල් හොයා ගන්නා වගේ මේ ගම්භීර ධර්මය තුල කිඳා බැහැල ධර්මය හොඳට ස්පර්ශ කරමින් කුසල අකුසල අව්‍යාකෘත යන ශක්ති එහෙට මෙහෙට හේතු වෙන විදිය තේරුම් අරගෙන සැම දෙනාටම මේ භයංකාර සංසාරයෙන්, හේතු ඵල ධර්ම තිබෙන තැන ඇති වෙන කර්කශ ගතියෙන් අයින්වෙලා, පාපී ගතියෙන් අයින්වෙලා ශාන්ත වූ ප්‍රණීත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ලැබේවා! නිවන් පිණිස මේ කුසලය මේ පින හේතු වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු !සාධු!

සීලවන්තං ගුණවන්තං – පුඤ්ඤං කෙත්තං අනුත්තරං
දුල්ලභේන මයා ලද්දං – පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං – ආගතං පටිපාටියා
සද්ධා ශීලං දයා වාසං – බුද්ධ පුත්තං නමාමහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.